ජගත් ජේ එදිරිසිංහ

# කටු 7

මෙතෙක් කතාව

ප්‍රසිද්ධ රංගන ශිල්පිණියක වන නිරාශා විවාහ වී සිටින්නේ පෙරළිකාර චිත්‍රපට අධ්‍යක්ෂ වරයකු වන විදුල මුණසිංහ සමගින් ය. තදින් මත් ද්‍රව්‍ය වලට ඇබ්බැහි වී සිටින මදාරා වෛද්‍යසේකර විදුලට හමුවන්නේ ඔහු සේවය කළ රාජ්‍ය නොවන සංවිධානයට අයත් පුනරුත්ථාපන නිවස්නයකදී ය. සරසවියේ අවසන් පරීක්ෂණයෙන් ඉහළ ලකුණු ලබා දෙන බවට දුන් පොරොන්දුව මත මදාරා විශ්ව විද්‍යාලයේ කථිකාචාර්යවරයකු වන තිසර සූරියබණ්ඩාරතිසරගේ කාමරයට යයි. ඇය විනාශ කර දමන තිසර නිසා ඇය මත්ද්‍රව්‍ය ගන්නට පෙළැඹෙයි. මදාරා ගේ කතාව දැනගන්නා විදුල ඒ අනුසාරයෙන් සිනමා පටයක් සඳහා තිරනාටකය ලියයි. විදුල හා එකට සරසවි අධ්‍යාපනය ලැබූ අමාත්‍යාංශයක ලේකම්වරියක වන සමදරා විජේසුන්දර ඇගේ ඇමතිවරයාගේ වාර්තා චිත්‍රපටයක් විදුල ලවා නිම කරවා ගැනීමට වෙහෙසෙයි. විදුල එය ප්‍රතික්ෂෙප කරයි. මදාරා පුනරුත්ථාපනයෙන් පසු නිවස්නයෙන් ඉවත්ව යයි.

අද එතැන් සිට

අසාර්ථක උත්සාහයක යෙදෙමින් මදාරා බස් නැවතුම කරා පිය මැන්නා ය. ඉක්මණින්ම ආ සෙනඟින් පිරී ගිය බසයට වදෙන් පොරෙන් ගොඩ වූවා ය. පාපුවරුවේ මැද සිටි කොන්දොස්තර කොලුවා ඇගේ පිටට අත තබා ඇය බසය තුළට තල්ලු කළේ ය. වෙනදාක නම් මේ අසංවර ක්‍රියාව ඇය කෝප ගන්වනු නියත ය. එනමුදු මේ ප්‍රසන්න දිනයේ ඇගේ සිතේ කෝපයක් හටනොගනියි. වෙනෙකක් තබා එකිනෙකාට තෙරපීගත් මිනිසුන්ගේ දහඩිය සුවඳ පවා ඇයට නොදැනුණි.

"මයි කන්ග්‍රැජුලේෂන්ස් මිස් වෛද්‍යසේකර.." ලයිෆ් ලයිට් ආයතනයේ ව්‍යාපෘති නිලධාරිනියක ලෙස පත් කරගන්නා ලද බව දන්වන ලිපිය



ලයිෆ් ලයිට් ඉන්ටනැෂනල් කාර්යාලයෙන් පිට වී පියගැට පෙළ බසින අතර ද මදාරා ගේ මුවේ ඇඳුණ සිනාව නොමැකී තිබුණි. අවසානයේ ජීවිතය යම්කිසි පිළිවෙළක් වෙමින් තිබෙන බව දැනෙන විට සිතේ සතුට තවත් වැඩි වෙයි.

ගිණිගත් නගරය නිවාලන්නට මෙන් සිහිල් මද පවනක් පාව යයි. ඒ අකීකරු සුළඟින් විසිරෙන සිය කෙහෙ රැලි එක්කර ගන්නට තමා අතට දෙන අතරේ ප්‍රධාන විධායක නිලධාරියා වන සිසිර කුලසේකර කී වදන් මදාරාට සිහිපත් වෙයි. ".. මේ පෝස්ට් එකට අපි ඔයා පත්කරගන්න තීරණය කළේ ඔයාගෙ එඩියුකේෂන් කොලිෆිකේෂන් වගේම මිස්ට විදුල මුණසිංහගෙ රෙකමන්ඩේෂන් එකත් සැළකිල්ලට අරගෙනයි.. අපට ඕනෙ ඕනෙම අභියෝගයකට මුහුණ දෙන්න පුලුවන් ශක්තිමත් ප්‍රොජෙක්ට් ඔෆිසර් කෙනෙක්.. ඒක පොඩි අභියෝගයක්.. මදාරාට ඒ අභියෝගයට මුහුණ දෙන්න පුලුවන් කියලා අපි විශ්වාස කරනවා.."

අභියෝග.. මදාරා සිත ඇතුලෙන් සිනාසුණා ය. අභියෝග තමාගේ ජීවිතයට අලුත් දෙයක් නොවේ. තමා මෙතුවක් කාලයක් ඒ සියලු අභියෝග හොඳින් නැත්නම් නරකින් ජයගත් ආකාරය තමාත් විදුලත් පමණක් දන්නා රහසක් ව පවතිනු ඇති බව ඇයට විශ්වාස ය.

"ඇයි කල්පනා කරන්නෙ...? මිස් වෛද්‍යසේකරට එක පාරටම මේ තනතුර ගැන තීරණයක් ගන්නා අමාරු නම් දවසක් දෙකක් ඇතුළත කල්පනා කරලා අපට තීරණය කියන්න.." නිලධාරියා නැවත කීවේ මදාරා කල්පනාවට වැටී සිටිනු දුටු බැවිනි. මදාරා ඔහු දෙස බලා සිනාසුණා ය.

"කල්පනා කරන්න දෙයක් නෑ මිස්ටර් කුලසේකර.. මං කැමතියි මේක බාර ගන්න.. මට පුලුවන් ඕනෙම අභියෝගයකට මුහුණ දෙන්න.." ඈ කීවා ය.

මදාරා ගේ ස්වරයේ තිබූ තිර බව සිසිර ගේ සිත් ගත්තේ ය. ඒ බව සඟවන්නට ඔහු උත්සාහ නොකළේ ය.

"සතුටුයි.." ඔහු කීවේ ය. "..මං අමුතුවෙන් කියන්න ඕනෙ නැහැනෙ මදාරා.. දැං කාලේ එන්ජීඕ එකක වැඩ කරනවා කියන එකම අභියෝගයක් වෙලානෙ තියෙන්නෙ.."

"මං දන්නවා මිස්ටර් කුලසේකර.. එන්ජීඕ එකක් කිව්වම දැන් හැමෝම වපරැහින්නෙ බලන්නෙ.. මට හිතෙන විදියට එහෙම වෙලා තියෙන්නෙ මිනිස්සුන්ගෙ වරදින්ම නෙවෙයි.. පිටරට සල්ලි වලට ඕනෙම පහත් වැඩක් කරන්න ලෑස්තිවෙලා ඉන්න සමහර එන්ජීඕස් ම තමයි විහින්ම තමන්ගෙ වල කපා ගන්නෙ.."

"ඔයා හොඳ පොයින්ට් එකකට ආවෙ මදාරා.. මං මේ වෙලාවෙම මේකත් ඔයාට කියන්න ඕනෙ.. අපිත් ක්‍රියාත්මක වෙන්නෙ පිටරට සල්ලි වලින් තමයි මදාරා.. අපි කරන විවිධ රිසර්ච් වලට අපට මුදල් ලැබෙනවා.. ඒත් මං ඔයාට පැහැදිලිවම කියන්නං අපේ රටට හානියක් වන කිසිම රිසර්ච් එකක් අපේ අතින් වෙන්නෙ නම් නැහැ.. අපට ප්‍රතිපත්තියක් තියෙනවා.. පැහැදිලිවම කියනවා නම් අපි සල්ලි වෙනුවෙන් අපේ ප්‍රතිපත්ති පාවා දෙන්නෙ නැහැ.. ඕනෙම රිසර්ච් එකක් බාරගන්න කලින් අපි හුඟක් දුර කල්පනා කරනවා.. ඒ සම්බන්ධ විවිධ පැති ගැන අපි හිතා බලනවා.. උදාහරණයක් ලෙස දැන් අපි ඔයාට මේ බාර දෙන්න යන පළවෙනි රිසර්ච් එක.. ඒ කියන්නෙ ලංකාවේ ආදි වාසීන්ගේ ජීවන රටාවට සංවර්ධන ක්‍රියාදාමය කොයි තරම් බලපෑමක් කරලා තියෙනවද කියන එක ගැන කෙරෙන මේ රිසර්ච් එක වුණත් අපි හැම කාරණයක්ම හොයලා බලලා තමයි බාර ගත්තෙ.."

සිසිර කුලසේකර අවංක මිනිසෙකැයි ඔහු කතා කරන විලාසය නිරීක්ෂණය කළ මදාරාට සිතුණි. ඔහු යටතේ සේවය කිරීම පහසු වනු ඇතැයි ඈ සිතුවා ය. රාජ්‍ය නොවන සංවිධානයක් හරහා සිය වෘත්තිය ගමන අරඹන්නට කැමැත්තක් මුලදී ඇගේ සිතේ නොතිබුණ ද ඇයට බාරගන්නට සිදුව ඇති ව්‍යාපෘතිය පිළිබඳ ඇල්ම ඒ අකැමැත්ත ඇගේ සිතින් පහ කර දමා තිබුණි.

"ප්‍රතිපත්තිගරුකව තමන්ගෙ වැඩ කොටස